# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# අනාවරණ පරීක්ෂණය – 2019
# සිංහල භාෂාව හා සාහිත්‍යය

6 ශ්‍රේණිය                                                                 කාලය පැ. 1.30

ශිෂ්‍යයා/ශිෂ්‍යාවගේ නම

පාසල

**සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න**

(01) පහත දී ඇති ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

අතීතයේ පටන් ශ්‍රී ලංකාව කෘෂිකර්මාන්ත කටයුතුවලින් බොහෝ රටවල ප්‍රසිද්ධ වී ඇත. ගොයම් වගාව "යල" හා "මහ" කන්න දෙක යටතේ ද හේන් ගොවිතැන මෙන් ම එළවළු සහ පලතුරු වශයෙන් ගොඩ ගොවිතැන ද තවමත් එදා මෙන්ම රැක ගනිමින් තිබේ.එදා පරාක්‍රමබාහු රජ සමයේ අපේ රට "පෙරදිග ධාන්‍යාගාරය" වශයෙන් ලොව ප්‍රචලිත විය. එකල වර්තමානයටත් වඩා ගොවිතැන් සෑම මුඩුබිමක් ම වසාගෙන තිබුණි. නූතනයේ කෘෂිකර්මාන්තය දියුණු තාක්ෂනික ක්‍රම ඔස්සේ වැඩිදියුණු වෙමින් පවතී.

I. ඡේදයෙන් කියවෙන්නේ කුමක් පිළිබඳව ද?
II. වගා කටයුතු කරන ප්‍රධාන කන්න දෙක මොනවා ද?
III. ප්‍රසිද්ධ යන්නට සමානාර්ථ පදයක් ඡේදයෙන් ම සොයා ලියන්න.
IV. පෙරදිග ධාන්‍යාගාරය ලෙස ප්‍රචලිත වූ රට කුමක් ද?
V. මුඩු බිමක් යනු කුමක් ද?
VI. නූතනයේ කෘෂි කර්මාන්තය දියුණු වෙමින් පවතින්නේ කුමක් නිසා ද?
VII. පලතුරු යන වචනයේ යෙදී ඇති පිල්ලම් අනුපිළිවෙළින් නම් කරන්න.
VIII. "එකල වර්තමානයටත් වඩා ගොවිතැන් සෑම මුඩු බිමක්ම වසාගෙන තිබුණි." මෙම වගන්තියේ ඇති විශේෂණ පදය යටින් ඉරක් අඳින්න.
IX. ඡේදයේ ඇති අක්ෂර වින්‍යාසය වැරදි ලෙස මුද්‍රණය වී ඇති වචනය සොයා එය නිවැරදි කර ලියන්න.
X. ඡේදයේ දක්නට ලැබෙන විරාම ලක්ෂණ නම් කරන්න.

(ලකුණු 2x10 = 20)

(02) වචන ගළපා අර්ථවත් වැකි සකස්කර නැවත ලියන්න.

I. පුද පඬුරු/ පිළිවෙසති/ සුබ/ කා/ මොහොතින්/ කිරිබත්/ දෙමාපියන්ට/ බැඳ/ කැලයට/ ගැමියෝ

..............................................................................................................

II. හසාරා/ චරිතය/ වේදිකාවේ/ සුරංගනාවියකගේ/ රඟපෑවාය

..............................................................................................................

III. බේරා ගැනීමට/ හරහා/ අසාර්ථක/ ගවයා/ විය/ පැන්න/ දැරූ/ උත්සාහය/ පාර/ රියදුරු

..............................................................................................................

IV. පිරෙයි/ මහ/ බොර/ වැස්සට/ ගඟ/ වතුරෙන්

.......................................................................................................................................

V. බඩී/ ලෝක/ මිල/ පහළ/ තෙල්/ වෙළඳපොළේ

.......................................................................................................................................

(ලකුණු 2x5 = 10)

(03) පෞද්ගලික ලිපියක තිබිය යුතු අංග පහත දැක්වේ. එය පිළිවෙළින් පෙළගැස්වූ විට තිබිය යුතු ආකාරය ලියා දක්වන්න.

අඩංගු කරුණු, යවන්නාගේ ලිපිනය, ආමන්ත්‍රණය, ආශිර්වාදය, ලියන දිනය, අවසානය.

I. ..................................................
II. ..................................................
III. ..................................................
IV. ..................................................
V. ..................................................
VI. ..................................................

(ලකුණු 1x6 = 6)

(04) පලමු පාසල් වාරයේ අද්‍යාපන වාරිකාව සැළසුම් කළ ගුරුතුමා අවසාන වාරයේ නිවාඩු දිනට පෙර එකමුතුගම කනිෂ්ට විද්‍යාලයේ වාර්ෂික තයාග ප්‍රධානෝත්සවය ද සංවිදානය කර තිබුණි. ඒ පිලිබඳ විදුහල්පතිතුමා මෙන්ම දෙමව්පියෝද ගුරුතුමාට ප්‍රසංශා කළහ.

ඉහත සඳහන් ප්‍රවෘත්තියේ අක්ෂර වින්‍යාසය සදොස් ය. එම වැරදි වචන තෝරා ඊට යටින් ඉරක් අඳින්න.එම ඉරි ඇඳි වචන නිවැරදි කර නැවත ලියන්න.

1. ____________________ 5. ____________________
2. ____________________ 6. ____________________
3. ____________________ 7. ____________________
4. ____________________ 8. ____________________

(ලකුණු 1x8 = 8)

(05) හිස්තැනට සුදුසු පදය තෝරා ඊට යටින් ඉරක් අඳින්න.

I. කිරිල්ලිය කිචි බිචි නද දෙමින් පරිසරය ගීතවත් ........................ (කළේ ය, කළා ය, කරති)
II. බල්ලා බුරමින් සොරුන් පසුපස ලුහු ........................ (බැන්දෝ ය, බඳිති, බැන්දේ ය) .
III. විභාගය අසමත් බව ඇසූ ........................ (තෝ, තොප, නුඹලා) සිත් තැවුලට පත් වූවෙහු ?
IV. පන්සලේ සණ්ඨා නාදය ඇසෙත්ම අපි ඒ දෙසට ගමන් ........................ (කළේ ය, කළෙමු, ගත්තේ ය).
V. මිනිසුන් අනතුර වූ ස්ථානයේ රස් කකා සිටිනු මම ........................ (දුටුවෙමු, දුටුවහ, දුටිමි).
VI. උණ පඳුර මද සුළඟට සිලි සිලි හඬ ........................ (නගති, නැගුහ, නගයි)

VII. .......................... (තරු, තාරකාවෝ, තරුහු) ගුවන්තලය සිසාරා නේක රටා මවයි.
VIII. ඇතැමෙක් ගංවතුරෙන් අසරණභාවයට පත්ව පන්සලේ ලැගුම් ......................... (ගත්තේ ය, ගත්තා ය,ගත්හ)
IX. ......................... (නැව, නෞකාහු, නැව්) මහ මුහුද තරණය කරමින් එතෙර බලා යති.
X. නංගී සෙල්ලම් කරන දෙස තාත්තා සතුටින් බලා .......................... (සිටියේ ය, සිටියා ය, සිටිති).

(ලකුණු 1x10 = 10)

(06) පහත දැක්වෙන ආරාධනා පත්‍රය කියවා ඒ ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

> **පුංචි අපේ සිතුවම් දැක්ම**
>
> මහව කලාප අධ්‍යාපන කලාපයේ
> කලාප අධ්‍යාපන අධ්‍යක්ෂතුමියගේ ප්‍රධානත්වයෙන්
> 2019 පෙබරවාරි 28 වැනි දින
> පෙ.ව.10.00 ට
> මහව "ප්‍රතිභා" ශාලාවේදී
> පැවැත්වේ.
> එය නැරඹීමට
> ඔබට කෙරෙන ගෞරවනීය
> **ආරාධනයයි.**
>
> සිහිති දරු කැල

I. මෙම ආරාධනාව කර ඇත්තේ කුමක් සඳහා ද?
II. මෙහි ප්‍රධාන ආරාධිත අමුත්තා කවුද?
III. මෙම වැඩසටහන පැවැත්වෙන්නේ කවදා ද?
IV. එය පැවැත්වෙන්නේ කොහේ ද?
V. එය ආරම්භ කරන්නේ කීයට ද?

(ලකුණු 2x5= 10)

(07) පහත දැක්වෙන ප්‍රස්තාව පිරුළු සම්පූර්ණ කරන්න.

1. .............................. කරවිල වැල ගියා වගේ.
2. වඩින්න ගිය ............................ හිසේ කඩා වැටුණා වාගේ.
3. පනින රිළවුන්ට ............................ බැන්දා වාගේ.
4. යුද්දෙට නැති කඩුව ............................ කොටන්න ද?
5. ............................ දිය බී මුහුදට ආ වඩන්නා වගේ.

(ලකුණු 2x5 = 10)

(08) පහත එක් එක් වචන කාණ්ඩ වෙනුවට යෙදිය හැකි තනිපදය ලියන්න.

1. සතුන් පිට බඩු පටවාගෙන යාම -
2. නැරඹීම සඳහා පැරණි වටිනා දේ එක් රැස්කොට තබා ඇති ස්ථානය -
3. ගසක අතු බෙදීගිය ස්ථානය -
4. කුඩා දේ ලොකුකර පෙන්වන උපකරණය -
5. කුරුල්ලන් ප්‍රීතිමත්ව කරනු ලබන නාදය -

(ලකුණු 2x5 = 10)

(09) පහත යුගල පද සම්පූර්ණ කරන්න.

1. ............................ බිමන්
2. ඉමක් ............................
3. යාන ............................
4. ............................ පිටි
5. ............................ බෝග

(ලකුණු 1x5= 5)

(10) පහත වගන්තිවල අදාළ තැන්හි විරාම ලකුණු යොදන්න.

1. මොනවා දෙවියනේ මේ මොන අපරාධයක් ද
2. පුතේ විභාගයට හොඳින් වැඩ කරන්න
3. අරළු බුළු නෙල්ලි රසකිඳ පැරණි දේශීය වෛද්‍යවරු භාවිතා කළ ශාකමය ඖෂධ වේ
4. මාර්ටින් වික්‍රමසිංහයෝ හෙළයේ මහා ගත්කරු යන විරුදාවලි නාමයෙන් පිදුම් ලැබූහ

(ලකුණු 1x5= 5)

(11) ගස් කොළන් ඇඹරෙමින් හමා ආ සුළඟත් සමඟ මහ වැස්සක් ඇද හැලුණි. ජනේලයෙන් පිටත බැලූ මට මිදුලට කඩා කඩා වැටුණු ලේන් කූඩුවක් දක්නට ලැබුණි. පුංචි පැටියෙකුගේ හඬ වගේ ම ලේන් අම්මාගේ විලාපය මට ඇසුණි. වහා ක්‍රියාත්මක වූ මම ................................

මෙතැන් සිට ඉදිරියට සිදුවන්නට ඇතැයි ඔබට සිතෙන දේ ඇසුරින් නිර්මාණශීලී වගන්ති තුනක් ලියන්න. සෑම වගන්තියක් ම වචන පහකට වැඩි විය යුතු අතර නිවැරදි අක්ෂර වින්‍යාසය මෙන් ම උක්ත ආඛ්‍යාත ගැළපුම නිවැරදි විය යුතුය.

(ලකුණු 2x3 = 6)